# ත්‍රිකුණාමලය වෙරුගල් ප්‍රදේශයෙන් හමු වූ වසර දෙදහසක් තරම් පැරණි සෙල්ලිපි

**නාමල් කොඩිතුවක්කු**[1]

නැගෙනහිර පළාත වූ කලී ශ්‍රී ලංකාවේ ඉතිහාසය ප්‍රකාශ කරන පුරාවිද්‍යාත්මක සාධකවලින් පරිපූර්ණ වූ බිම් කඩකි. මෑත ඉතිහාසයේ ක්‍රියාකාරී වූ ජනවාර්ගික යුධ ගැටුම් නිසා මේ ප්‍රදේශයේ ඇති ඇතැම් වටිනා පුරාවස්තු විතැන් විය. එහි තීරණාත්මක කඩ ඉමක් සනිටුහන් කළ ආසන්න වර්ෂ කිහිපය තුළ දී මේ විතැන් වූ පුරාවස්තු පිළිබඳ හෙළිදරව් වන්නට විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එවැනි පුරාවස්තු සහිත සැලකිය යුතු භූමි ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු අනාවරණය කරගන්නා ලද අතර එවැනි එක් ස්ථානයක් පිළිබඳ තොරතුරු මෙයින් ඉදිරිපත් කෙරේ.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරුගල් ප්‍රදේශය රජයේ හමුදා විසින් එල්.ටී.ටී.ඊ. ග්‍රහණයෙන් මුදා ගැනීම සිදු වූයේ උක්ත සඳහන් වකවානුව (2007) තුළ දී ය. එම භූමියෙන් ගරාවැටුණු ස්තූප, සෙල්ලිපි, මැටි බඳුන් කැබලි, උළු කැබලි වැනි සංස්කෘතික අවශේෂ හමු විය. ඒවා වසර දෙදහසක් පමණ අතීතයකට හිමිකම් කියන පුරාවස්තු වේ. මීටර් 25 ක් පමණ වපසරියක ඇති සෙල්ලිපි පහ මේ අතරින් විශේෂ වේ. සෙන්ටි මීටර් 8-10 තරම් විශාල බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියා ඇති මෙම ලිපිවල ඇතැම් කොටස් පතුරු ගැලවී විනාශ වී ඇත. නමුත් පැහැදිලි කොටස් කියවා ගැනීමෙන් මෙම භූමියේ අතීත ක්‍රියාකාරිත්වය පිළිබඳ වඩාත් විශ්වසනීය වූත් තාර්කික වූත් ඉතිහාසයක් ගොඩනගා ගත හැකිය. එසේම සෙල්ලිපි සහිත මෙම පර්වත මස්තකයේ තනා තිබූ ගුවන් විදුලි සම්ප්‍රේෂණ කුළුණත් ඒ හා බැඳුණු තවත් සාධකත් මගින් මෙම සෙල්ලිපි සහිත අනෙකුත් පුරාවස්තු විතැන් වූ මෑත කාලීන ඉතිහාස ක්‍රියාකාරිත්වය පිළිබඳ ව ද විද්‍යමාන වෙයි.

**ප්‍රමුඛ පද:** වෙරුගල් ප්‍රදේශය, වසර දෙදහසක් පැරණි සෙල්ලිපි
**Title:** Two thousand years old inscriptions in Veragala region, Trincomalee
**Keywords:** Verugal region, two thousand years old inscriptions

[1] අභිලේඛන හා නාණකවිද්‍යා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07